සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

පෙරදිග සංගීතය I
கீழைத்தேய சங்கீதம் I
Oriental Music I

54 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1-5 | |
| 02 | 6-13 | |
| 03 | 14-19 | |
| 04 | 20-27 | |
| 05 | 28-34 | |
| 06 | 35-44 | |
| 07 | 45-50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

● අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා එය අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** ස ම රි ග, රි ප ග ම, _ _ _ _ වශයෙන් යෙදෙන ස්වර අභ්‍යාසයේ අවරෝහණ ස්වර රටාව ආරම්භ වන ස්වර ඛණ්ඩය තෝරන්න.

(1) ස් ධ නි ප (2) ස් නි ප ධ (3) ස් ප ධ නි (4) ස් ප නි ධ (5) ස් ධ ප නි (......)

**2.** මධ්‍යමය සහ ෂඩ්ජය පිළිවෙලින් වාදී සහ සංවාදී වශයෙන් යෙදෙන රාග යුගලය ඇතුළත් වරණය තෝරන්න.

(1) මාල්කෞන්ස් – ආසාවරි (2) ආසාවරි – හංසධ්වනි
(3) හංසධ්වනි – ජයජයවන්ති (4) ජයජයවන්ති – බාගේශ්‍රී
(5) බාගේශ්‍රී – මාල්කෞන්ස් (......)

**3.** විවිධ සංගීතවේදීන් විසින් හංසධ්වනි රාගය කල්‍යාණ මේලගත වේ යැයි සඳහන් කර ඇති නමුත්, භාත්ඛණ්ඩේ පඬිතුමාගේ මතය අනුව එය අයත් වන මේලය වනුයේ,

(1) භෛරවී ය. (2) බිලාවල් ය. (3) ඛමාජ් ය. (4) මාර්වා ය. (5) කාෆි ය. (......)

**4.** දේස් රාගයෙහි රාග ජාතිය

(1) සම්පූර්ණ වේ. (2) ෂාඩව වේ. (3) ඖඩව වේ.
(4) ඖඩව – ෂාඩව වේ. (5) ඖඩව - සම්පූර්ණ වේ. (......)

**5.** සමප්‍රකෘති රාග යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ආසාවරි – දේස් (2) දේස් – ජයජයවන්ති
(3) ජයජයවන්ති – බාගේශ්‍රී (4) බාගේශ්‍රී – ජෞනපූරි
(5) ජෞනපූරි – ආසාවරි (......)

[redacted]

6. රාග ආරෝහණ සහ අවරෝහණ ස්වර ලියා දක්වන ආකාරය අනුව, 'රිමප' ස්වර සංගතිය මනා ලෙස යෙදෙන රාගයක් වන්නේ,

(1) දේස් රාගයයි.
(2) ආසාවරී රාගයයි.
(3) ජයජයවන්ති රාගයයි.
(4) ජෞන්පුරී රාගයයි.
(5) තිලක්කාමෝද් රාගයයි.

(......)

7. ගානසමය සිද්ධාන්තය අනුව, මේල වර්ගීකරණයේදී එකම කාණ්ඩයක් යටතට ගැනෙන මේල දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) කල්‍යාණ – කාෆි
(2) පූර්වි – මාර්වා
(3) භෛරව – භෛරවි
(4) තෝඩි – බිලාවල්
(5) ආසාවරී – ඛමාජ්

(......)

● අංක **8** සිට **10** දක්වා ප්‍රශ්න සඳහා පහත රාගධාරී ස්වර ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

| ධ ප ධ | ම ප ම ග | (ම) – රි | ස – ග ම |

X 2 0 3

8. ඉහත රාගධාරී ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය සහ තාලය ඇතුළත් වරණය තෝරන්න.

(1) ජෞන්පුරී – ජප්තාලය
(2) ආසාවරී – දීප්චන්දී තාලය
(3) කාලිංගඩා – ජප්තාලය
(4) භෛරව – දීප්චන්දී තාලය
(5) මාල්කෞන්ස් – ජප්තාලය

(......)

9. ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය අයත් වන සුවිශේෂී රාග විශේෂය තෝරන්න.

(1) පූර්ව කාලීන
(2) [illegible] සන්ධි ප්‍රකාශ
(3) සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ
(4) පරමේල ප්‍රවේශක
(5) පූර්වාංග වාදී

(......)

10. ඉහත ස්වර ප්‍රස්තාරයෙහි 'ඛාලි' ස්ථානයෙහි යෙදී ඇති ස්වරය උත්පාදනයේ දී, අදාළ ( ) සංකේතය අනුව හඳුන්වන විශේෂ නාමය තෝරන්න.

(1) මූර්කි
(2) ගමක්
(3) ආන්දෝලිත
(4) කන්
(5) අධිව දර්ශක

(......)

11. සරි ගම නිස ගරි පනි පප ගරි ස– වශයෙන් යෙදෙන තානාලංකාර හඳුන්වනු ලබන විශේෂිත නාමය තෝරන්න.

(1) සපාට තාන
(2) කූට තාන
(3) අලංකාරික තාන
(4) මිශ්‍ර තාන
(5) අවරෝහී තාන

(......)

● අංක **12** සහ **13** ප්‍රශ්න සඳහා පහත දැක්වෙන තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

※ උත්තර භාරතීය රාගධාරී ගායන ශෛලීන් කිහිපයකට අදාළ ප්‍රකාශන පහතින් දක්වා ඇත.

A – ආලාප සහ තානාලංකාර ගායනය සිදු වේ.
B – ගීතය, ස්ථායි සහ අන්තරා කොටස්වලින් යුක්ත වේ.
C – සම, දෙගුණ, තුන්ගුණ, සිව්ගුණ යනාදී වශයෙන් විවිධාකාර වූ ලයකාරී අංග අනුව ගීතය ගැයීම ප්‍රධාන ලක්ෂණයකි.
D – පඛාවාජයෙන් වැයෙන තාල භාවිත වේ.

12. ඛයාල් සහ තරාණා යන ගායන ශෛලීන් දෙකට ම අදාළ ලක්ෂණ සඳහන් වනුයේ කුමන අක්ෂර යටතේ ද?

(1) A සහ B
(2) A සහ C
(3) A සහ D
(4) B සහ C
(5) B සහ D

(......)

13. C සහ D අක්ෂර යටතෙහි සඳහන් කරුණු දෙකට ම අදාළ ගායන ශෛලීන් දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) ධ්‍රැපද් සහ ඛයාල්
(2) ඛයාල් සහ ඨුම්රි
(3) ඨුම්රි සහ තරාණා
(4) තරාණා සහ ධමාර්
(5) ධමාර් සහ ධ්‍රැපද්

(......)

14. බයාල් ගායනයේ දී ගී පද (වචන) උච්චාරණයෙන් ආලාපය ගයනු ලබන විට එය හඳුන්වනු ලබන විශේෂ නාමය තෝරන්න.

(1) නෝම් තෝම් ආලාප
(2) බෝල් ආලාප
(3) බඩත් ආලාප
(4) පූර්ව ආලාප
(5) මධ්‍ය ආලාප (......)

15. ධරණකය (bridge) සත්ත්ව හමකින් ආවරණය වූ (තුම්බා/පයාලා) කොටසෙහි රඳවා ඇති, අනුනාදවලින් යුත්, පර්දා රහිත ඉන්දියානු තත් වාද්‍ය භාණ්ඩ දෙකක නම් සඳහන් වරණය තෝරන්න.

(1) සාරංගි – එස්රාජ්
(2) එස්රාජ් – සිතාර්
(3) දිල්රුබා – සන්තූර්
(4) සන්තූර් – සරෝද්
(5) සරෝද් – සාරංගි (......)

16. | ධාධා තිරකිට ධාධා තිරකිට | ධාධා තිරකිට ධාධා තූනා | තාතා තිරකිට තෙත තිරකිට | ධාධා තිරකිට ධාධා තූනා |

| ධාධා තිරකිට ධා–තිත් ධා–තිත් | ධා + ධාධා තිරකිට | ධා–තිත් ධා–තිත් ධා + | ධාධා තිරකිට ධා–තිත් ධා–තිත් |

| ධා

| x | 2 | 0 | 3 |

ත්‍රිතාලයට අනුව වැයෙන ඉහත තාල අලංකාර කොටසෙහි ඇතුළත් අංග පෙන්නුම් කර ඇති වරණය තෝරන්න.

(1) කායදා – පල්ටා
(2) කායදා – මුඛඩා
(3) මුඛඩා – රේලා
(4) රේලා – තිහායි
(5) පල්ටා – තිහායි (......)

17. ත්‍රිතාල්, පංජාබි සහ තිලවාඩා යන තාල එකිනෙක සැසඳීමේ දී එම තාල තුන සම්බන්ධයෙන් වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ගතියෙන් සමාන නමුත්, මිතියෙන් වෙනස් වේ.
(2) මිතියෙන් සමාන නමුත්, ගතියෙන් වෙනස් වේ.
(3) ගතියෙන් හා මිතියෙන් යන දෙකෙන් ම වෙනස් වේ.
(4) ගතියෙන් හා මිතියෙන් යන දෙකෙන් ම සමාන වේ.
(5) ගතියෙන් හා මිතියෙන් විටෙක සමාන ද, විටෙක වෙනස් ද වේ. (......)

18. න නාදේන විනා ගීතං – න නාදේන විනා ස්වරං

න නාදේන විනා නෘත්‍යං – තස්මාත් නාදාත්මකං ජගත්

වශයෙන් වූ ශ්ලෝකය සඳහන් ව ඇති මූල ග්‍රන්ථයේ නම ඇතුළත් වරණය තෝරන්න.

(1) සංගීත පාරිජාත
(2) බෘහද්දේශී
(3) සංගීත රත්නාකර
(4) නාට්‍ය ශාස්ත්‍ර
(5) ක්‍රමික් පුස්තක් මාලිකා (......)

19. සක වෙත මෙත් පතළ - මුනි දම් සඟ රුවන
ඉහත ගී පාදයන්හි වචනාර්ථ නො බිඳෙන ලෙස යෙදීමේ දී වඩාත්ම ගැළපෙන දේශීය තිත් රූපය පහත වරණ අතුරෙන් තෝරන්න.

(1) | 1 2 | 1 2 | 1 2 | 1 2 3 4 |
(2) | 1 2 | 1 2 | 1 2 | 1 2 3 |
(3) | 1 2 | 1 2 | 1 2 3 4 | 1 2 3 4 |
(4) | 1 2 | 1 2 | 1 2 3 | 1 2 3 |
(5) | 1 2 | 1 2 3 | 1 2 3 | 1 2 3 4 | (......)

**20.** පහත සඳහන් ශාන්තිකර්ම ගී පාද අතුරෙන්, සඳැස් මත් ගණන 24 ක් වන, මැදුම් තනිතිත අනුව ගැයෙන ගී පාදය තෝරන්න.

(1) ගුණ දැනේ බෝසත් අනේ පෙර ඉපදුනේ ගිරවෙකු මෙමනේ
(2) සුද්ධෝදන රජුට දාව උපන් ර තරවර
(3) නිරිත කොන යුතා මල් මල් සුවඳැති වැටකෙ වන වෙතා
(4) සුරතට රැගෙන පත්දම යාගෙට ඇදුරා
(5) ආල වඩන ගන්ධ කුටියෙ මුනි වැඩ සිට ගෙන (.....)

**21.** ජන ජීවිතය තුළ ජීවන වෘත්තියක් හා බැඳුණු ගී විශේෂය තෝරන්න.

(1) තැලවිලි ගී (2) බඹර ගී (3) කෙළි ගී
(4) ටීකා සී පද (5) ඇඳහිලි ගී (.....)

**22.** 'සංගීත සම්භවය' සහ 'සංගීත සංහිතා' යන ග්‍රන්ථ දෙක රචනා කළ ගත් කතුවරුන් දෙදෙනාගේ නම් පිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.

(1) වින්සන්ට් සෝමපාල සහ ආනන්ද ජයසිංහ
(2) ආනන්ද ජයසිංහ සහ විමල් අභයසුන්දර
(3) සී. ද. එස්. කුලතිලක සහ ඩබ්ලිව්.බී. මකුලොලුව
(4) සී. ද. එස්. කුලතිලක සහ විමල් අභයසුන්දර
(5) ඩබ්ලිව්. බී. මකුලොලුව සහ වින්සන්ට් සෝමපාල (.....)

**23.** නූර්ති සංගීතය සඳහා පමණක් සුවිශේෂී වූ කරුණු ඇතුළත් වරණය තෝරන්න.

(1) ෆෙදාගොරාව, උරුට්ටුව (2) පොතේ විරිදුව, කවිය
(3) ස්ථායි, අන්තරා (4) මද්දලය, තබ්ලාව
(5) අලගනායිඩු, ජයාංකාර (.....)

**24.** නූර්ති සහ නාඩගම් යන රංග ශෛලීන් පිළිබඳ ව නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.

(1) ස්ථායි-අන්තරා ගීත ආකෘතිය නූර්ති සහ නාඩගම් ගීත [illegible] වේ.
(2) 'තෙරුක්කූත්තු' නමැති ඉන්දියානු වීදි නාට්‍ය සම්ප්‍රදායෙන්, නූර්ති සහ නාඩගම් [illegible] ඇත.
(3) නූර්ති සඳහා හින්දුස්තානි සංගීත ආභාසයත් නාඩගම් සඳහා කර්ණාටක සංගීත ආභාසයත් ලැබී ඇත.
(4) ප්‍රථම සිංහල නූර්තිය 'රොමලින් හෙවත් දිව්‍ය කුසුම්' වූ අතර, [illegible] ප්‍රථම සිංහල නාඩගම විය.
(5) නාඩගම් සඳහා ගමින් ගමට හැසිරෙන [illegible], නූර්ති ගී ගායනය [illegible] වේ. (.....)

**25.** ෂඩ්ජ ස්වරයෙහි කම්පන වාර සංඛ්‍යාතය 256 Hz ක් නම්, [illegible] ස්වරයන්ගේ කම්පන වාර සංඛ්‍යාත පිළිවෙලින් සඳහන් වන වරණය තෝරන්න.

(1) 480 Hz- 260 Hz (2) 512 Hz - 384 Hz (3) 480 Hz- 360 Hz
(4) 512 Hz- 360 Hz (5) 512 Hz - 480 Hz (.....)

**26.** රාගධාරී ශාස්ත්‍රීය ගායනයේ දී සහාය ශ්‍රැති වාදනය සඳහා යොදා ගනු ලබන සංගීත භාණ්ඩය තෝරන්න.

(1) සාරංගි (2) සන්තූර් (3) දිල්රුබා (4) ස්වර මණ්ඩල (5) [illegible] (.....)

**27.** | රි ග ස රි | ග – – – | රි ම ග රි | ස – – – |

ඉහත ස්වර පාදය C Major ස්කේලයට අයත් යැයි සලකා එම ස්වර පාදය E♭ Major ස්කේලයට පෙරළා ලියා ඇති නිවැරදි වරණය තෝරන්න.

(1) | ම ප ග ම | ප – – – | ම ධ ප ම | රි – – – |
(2) | ම ප ග ම | ධ – – – | ම ධ ප ම | ග – – – |
(3) | ම ප රි ග | ප – – – | ම ධ ප ම | ග – – – |
(4) | ම ප ග ම | ප – – – | ම ධ ප ම | ග – – – |
(5) | ම ප ග ම | ප – – – | ම ප ම රි | ග – – – | (.....)

● අංක 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ස්වර ප්‍රස්තාරය උපයෝගී කරගන්න.




28. ඉහතින් දක්වා ඇති අපරදිග ස්වර පාදය පෙරදිග සංගීත ක්‍රමයට අනුව ලියා ඇති නිවැරදි වරණය තෝරන්න.

(1) | ප – – | ප – ප | පප ප -ප | ප ප -ප |

(2) | ප – – | ප ප – | පප ප -ප | ප -ප ප |

(3) | ප – ප | ප – ප | පප ප -ප | ප -ප ප |

(4) | ප – – | ප – ප | පප ප පප | ප -ප ප |

(5) | ප – – | ප – ප | පප ප -ප | ප -ප ප | (……)

29. ඉහත බටහිර ස්වර ප්‍රස්තාරයෙහි 'A' අක්ෂරයෙන් සහ 'B' අක්ෂරයෙන් දක්වා ඇති ස්වරවල වටිනාකම් අනුපිළිවෙලින්

(1) Dotted Crotchet සහ Demi Semi-Quaver වේ.

(2) Dotted Quaver සහ Semi Quaver වේ.

(3) Dotted Crotchet සහ Quaver වේ.

(4) Dotted Quaver සහ Demi Semi-Quaver වේ.

(5) Dotted Minim සහ Quaver වේ. (……)

30. තත් (strings), සුෂිර (wind) සහ සමාඝාත (percussion) වශයෙන් අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව පිළිවෙලින් සංගීත භාණ්ඩ පෙළ ගස්වා ඇති නිවැරදි වරණය තෝරන්න.

(1) Violin – Key board – Tuba

(2) Mandolin – Trumpet – Cymbal

(3) Oboe – Flute – Xylophone

(4) Cello – Vibraphone – Snare drum

(5) Harp – Glockenspiel – Triangle (……)

● අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවල ඇති හිස් තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

31. ස්වර සප්තකයක් තුළ ඇතුළත් ස්වර 12 සඳහා ස්වර නාම යොදා ඇත. ඉන්දියානු සංගීත සම්ප්‍රදායට අනුව **එම ස්වර නාම සංඛ්‍යාව** කර්ණාටක සංගීත පද්ධතියෙහි …………… ක් ලෙස ද ………………………… සංගීත පද්ධතියෙහි 12 ක් ලෙස ද භාවිත වේ.

32. හින්දුස්තානි සංගීතයෙහි දස ථාට්‍ය (මේලය) හඳුන්වා දෙන ලද්දේ ………………………………… පඬිතුමා විසින් වන අතර, කර්ණාටක සංගීතයෙහි (ථාට්) මේල …………… සංඛ්‍යාවකින් යුතු වර්ගීකරණය සිදු කරන ලද්දේ ව්‍යංකටමුඛී පඬිතුමා විසිනි

33. ගුලාම් අලි සහ පංකජ් උදාස් නම් ගායකයින් …………………….. ගායන ශෛලිය සඳහා ද, පණ්ඩිත් භිම්සෙන් ජෝෂි සහ පණ්ඩිත් ජස්රාජ් යන ගායකයින් …………………….. ගායන ශෛලිය සඳහා ද සුප්‍රසිද්ධ ය.

34. 'තිරිකිට' යන අවනද්ධාක්ෂර යෙදෙන, මාත්‍රා 16 ක යේකාවකින් යුත් නිර්දේශිත තාලයෙහි නම ………………… වන අතර, එම අවනද්ධාක්ෂර යෙදෙන, මාත්‍රා 12 ක යේකාවකින් යුත් නිර්දේශිත තාලයෙහි නම ………………… වේ.

[redacted]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம்: 54

විෂයය / பாடம்: පෙරදිග සංගීතය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 01 | 21. | 02 |
| 02. | 05 | 12. | 01 | 22. | 04 |
| 03. | 02 | 13. | 05 | 23. | 03 |
| 04. | 01 | 14. | 02 | 24. | 03 |
| 05. | 05 | 15. | 05 | 25. | 02 |
| 06. | 03 | 16. | 05 | 26. | 04 |
| 07. | 02 | 17. | 02 | 27. | 04 |
| 08. | 04 | 18. | 02 | 28. | 05 |
| 09. | 02 | 19. | 02 | 29. | 03 |
| 10. | 01 | 20. | 03 | 30. | 02 |

● අංක 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ස්වර ප්‍රස්තාරය උපයෝගී කරගන්න.




28. ඉහතින් දක්වා ඇති අපරදිග ස්වර පාදය පෙරදිග සංගීත ක්‍රමයට අනුව ලියා ඇති නිවැරදි වරණය තෝරන්න.

(1) | ප – – | ප – ප | පප ප ප | ප ප ප |

(2) | ප – – | ප ප – | පප ප ප | ප ප ප |

(3) | ප – ප | ප – ප | පප ප ප | ප ප ප |

(4) | ප – – | ප – ප | පප ප පප | ප ප ප |

(5) | ප – – | ප – ප | පප ප ප | ප ප ප | (......)

29. ඉහත බටහිර ස්වර ප්‍රස්තාරයෙහි 'A' අක්ෂරයෙන් සහ 'B' අක්ෂරයෙන් දක්වා ඇති ස්වරවල වටිනාකම් අනුපිළිවෙලින්

(1) Dotted Crotchet සහ Demi Semi-Quaver වේ.

(2) Dotted Quaver සහ Semi Quaver වේ.

(3) Dotted Crotchet සහ Quaver වේ.

(4) Dotted Quaver සහ Demi Semi-Quaver වේ.

(5) Dotted Minim සහ Quaver වේ. (......)

30. තත් (strings), සුෂිර (wind) සහ සමාඝාත (percussion) වශයෙන් අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව පිළිවෙලින් සංගීත භාණ්ඩ පෙළ ගස්වා ඇති නිවැරදි වරණය තෝරන්න.

(1) Violin – Key board – Tuba
(2) Mandolin –Trumpet – Cymbal
(3) Oboe – Flute – Xylophone
(4) Cello – Vibraphone – Snare drum
(5) Harp – Glockenspiel – Triangle (......)

● අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවල ඇති හිස් තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

31. ස්වර සප්තකයක් තුළ ඇතුළත් ස්වර 12 සඳහා ස්වර නාම යොදා ඇත. ඉන්දියානු සංගීත සම්ප්‍රදායට අනුව එම **ස්වර නාම සංඛ්‍යාව** කර්ණාටක සංගීත පද්ධතියෙහි ......16...... ක් ලෙස ද ......හින්දුස්ථානි...... සංගීත පද්ධතියෙහි 12 ක් ලෙස ද භාවිත වේ.

32. හින්දුස්තානි සංගීතයෙහි දස ථාඨය (මේලය) හඳුන්වා දෙන ලද්දේ ......භාත්ඛණ්ඩේ...... පඬිතුමා විසින් වන අතර, කර්ණාටක සංගීතයෙහි (ථාඨ) මේල ......72...... සංඛ්‍යාවකින් යුතු වර්ගීකරණය සිදු කරන ලද්දේ වෙංකටමුඛී පඬිතුමා විසිනි.

33. ගුලාම් අලි සහ පංකජ් උදාස් නම් ගායකයින් ......ගසල්...... ගායන ශෛලිය සඳහා ද, පණ්ඩිත් භීම්සෙන් ජෝෂි සහ පණ්ඩිත් ජස්රාජ් යන ගායකයින් ......ඛයාල්...... ගායන ශෛලිය සඳහා ද සුප්‍රසිද්ධ ය.

34. 'තිරිකිට' යන අවනද්ධාක්ෂර යෙදෙන, මාත්‍රා 16 ක යේකාවකින් යුත් නිර්දේශිත තාලයෙහි නම ......තිලවාඩා...... වන අතර, එම අවනද්ධාක්ෂර යෙදෙන, මාත්‍රා 12 ක යේකාවකින් යුත් නිර්දේශිත තාලයෙහි නම ......ඒක්තාල්...... වේ.

35. මැදුම් මහ ගෙදරිගට සමාන පිදුම ලවාවකින් යුත් නිර්දේශිත හින්දුස්ථානි තාලය ....දීප්චන්දි.... නමින් හැඳින්වෙන අතර, අනුතාල ස්ථාන තුනකින් යුත්, පස්මාත්‍රයෙන් වැයෙන නිර්දේශිත හින්දුස්ථානි තාලය ....ඣප්තාල්.... නමින් හැඳින් වේ.

අංක 36 සිට 38 තෙක් ඇති ප්‍රශ්නවලට පහත සඳහන් සිද්ධිය අනුසාරයෙන් අදාළ පිළිතුරු සපයන්න.

● අ.පො.ස. (උ.පෙළ) විභාග අපේක්ෂිකාවක් විසින් සිය සංගීත භාණ්ඩයේ ප්‍රධාන තත, මංකාලව ආධාරයෙන් සියුම් ලෙස මන්ද්‍ර මධ්‍යම ස්වරයට සුසර කර ගනිමින්, නිර්දේශිත රාගයකින් වැයූ රසාඛානි ගත් වාදන මාධ්‍යයෙහි, දී

| සස රිම සරි මප | ධධ මප රිම පධ | මම පධ මප ධනි | ධධ සරි ගුරි ස – |

x 2 0 3

ලෙස තානාලංකාරයක් වයන ලදී.

36. අපේක්ෂිකාව විසින් වයන ලද රාගය ....ආසාවරී.... නමින් හැඳින්වෙන අතර, එම රාගයෙහි යෙදෙන විකෘති ස්වර සංඛ්‍යාව ....03.... කි.

37. එම රසාඛානි ගත් වාදනය ....මධ්‍ය.... ලයෙන් වයන ලද අතර, ඒ සඳහා වයන ලද තාලය ....තීන්තාල්.... නම් වේ.

38. ....සිතාර්.... නමැති තත් වාද්‍ය භාණ්ඩයෙන් වයන ලද ඉහත තානාලංකාරයේ ස්වර යෙදී ඇති ආකාරය අනුව එය ....අලංකාරික.... තාන වර්ගයට අයත් ය.

39. ....හංසධ්වනි.... රාගයෙහි මුඛ්‍යාංගය 'ගප නිපගරි, රිගපරිස' වශයෙන් යෙදෙන අතර, 'ධනි සරිගස, රිපමග සනි' වශයෙන් මුඛ්‍යාංගය යෙදෙනුයේ ....බිලාස්ඛානිතෝඩි.... රාගයෙහි ය.

40. රාග ජාතිය පිළිබඳ විවිධ මත පිළිබිඹු වන භාෂී මෙල්‍යතා ....බාගේශ්‍රී.... රාගයෙහි, ආරෝහණයේ සහ අවරෝහණයෙහි පංචම ස්වරය සඳහන් ව නොමැති නමුත්, එය ....විවාදී / ආගන්තුක.... ස්වරයක් ලෙස රාග විස්තාරණයෙහි දී යොදා ගැනේ.

41. එක් ස්වරයක් සඳහා තත් තුනක් හෝ හතරක් බැගින් අඩංගු සකසා ඇති 'කලම්' නමැති ලපකාරණ කට්ටලයකින් වයනු ලබන සංගීත භාණ්ඩය ....සන්තූර්.... නමින් හැඳින්වෙන අතර එම භාණ්ඩය වාදනයට සුප්‍රකට ඉන්දියානු වාද්‍ය ශිල්පියෙකු වන්නේ ....ශිවකුමාර් ශර්මා.... ය.

42. 'සැඩසුළං' චිත්‍රපටය සඳහා ....එස්. දක්ෂිණාමූර්ති.... ගුරුන් විසින් ද, 'විසිදෑල' චිත්‍රපටය සඳහා ....ශරත්චන්ද්‍ර වීරසිංහ.... ගුරුන් විසින් ද සංගීත නිර්මාණය කරන ලදී.

43. ස්කේල (Scales) පිළිබඳ පිළිගත් සම්මත න්‍යායට අනුව F මේජර් ස්කේලයට අයත් මූලික කෝඩ්ස් තුන F, ..$B^b$.. සහ C වන අතර, A මේජර් ස්කේලයට අයත් මූලික කෝඩ්ස් තුන වනුයේ A, D සහ ..E.. ය.

44. T = Tone ; S = Semitone

ස්වර අන්තර පරතරයන් TTSTTTS ලෙස අනුක්‍රමයෙන් යෙදෙනුයේ ....මේජර්.... ස්කේලයෙහි වන අතර, TSTTSTT ලෙස අනුක්‍රමයෙන් යෙදෙනුයේ ....මයිනර්.... ස්කේලයෙහි ය.

(තම්බරුපුරම්පෙට්ටුකාර)

**45.** මහනුවර යුගයේ දී විදේශීය තූර්ය භාණ්ඩ පරිහරණය කළ වාද්‍ය කණ්ඩායම .....තම්බෙරුපුරම්පෙට්ටුකාර අංශය නමින් හඳුන්වා ඇති අතර දවුල්, තම්මැට්ටම, හොරණෑ ආදියෙන් සමන්විත වූ වාද්‍ය කණ්ඩායම ..........සිංගාරක්කාර.......... අංශය නමින් හඳුන්වා ඇත.

**46.** | දොං | තකු | දොං | ජිංතකු | තරිකිට

මෙම බෙර පදය ඇසුරෙන් උඩරට නර්තන සම්ප්‍රදායට අයත්වන ..........මංගලම්........ නර්තනය නිර්මාණය කර ඇති අතර එම කවිය ගායනය කරනු ලබන තිත ...ගුන්ගුළ දෙමළහනස්තිය නමින් හැඳින්වේ.

**47.** මහනුවර යුගයේ දී චන්දිභට්ටයින් විසින් ගයන ලද ගී ..........ප්‍රශස්ති.......... නමින් හඳුන්වා ඇති අතර, 'ලේසිනොව බැඳ අල්ලා' යන ගීතය ..........හටන්...... ගී නමින් හැඳින්වේ.

**48.** ලෙස්ටර් ජේම්ස් පීරිස්ශූරීන් විසින් අධ්‍යක්ෂණය කරන ලද ........දෙලොවක් අතර.......... නම් වූ චිත්‍රපටයෙහි ඇතුළත් 'ගයන ගැයුම් - නටන නැටුම්' යන ගීතය ගායනය සඳහා දායක වී ඇත්තේ නෙවිල් ප්‍රනාන්දු ප්‍රමුඛ ..........ලොස්කැබලෙරෝස්...... නම් වූ සංගීත කණ්ඩායම ය.

**49.** වාද්‍ය වෘන්දයක් සඳහා කිසියම් තේමාවකට අනුකූල ව කරන ලද අපරදිග සංගීත සංරචනය ..........සංධ්වනි (සිම්පනි) නමින් හැඳින්වෙන අතර, ගායනය, වාදනය හා රංගනය යන අංග තුන ම ඇතුළත් අපරදිග ගීත නාටක විශේෂය ..........ඔපෙරා... නමින් හැඳින් වේ.

**50.** 'මිඩිකේබල්' සහ 'කියුබේස් 5' අතුරෙන් මයික්‍රොෆෝන් සහ ස්වර පුවරු ආදිය පරිගණකය සමඟ සම්බන්ධ කිරීමට භාවිත කරනු ලබන දෘඩාංගය ..........මිඩිකේබල්..... වන අතර ..........කියුබේස් 05...... යනු පරිගණක නිර්මාණයන් පටිගත කිරීම සඳහා යොදාගන්නා මෘදුකාංගයකි.

* * *

[redacted]

## I කොටස

1. පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර සංගති කිහිපයකි.

   A – ම ප නි ධ, ප ධ, ම ග රි ග ස

   B – ම ප ධ ග, ම ග, ස ම ග රි ස

   C – ම ප ධ ස, නි ධ, ම ප ග රි ස

   (i) ඉහත රාග තුන හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 06 යි.)

   (ii) එම රාග තුනෙන් කැමති රාගයකට අදාළ ඛයාල් මණ්ඩලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්ථාර කරන්න. (ලකුණු 08 යි.)

   (iii) ඉහත (i) හි නම් කළ රාග තුනට අදාළ 'මේල' සහ 'ගායනයාම' වෙන් වෙන් ව එම රාගවල නම් සමග ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(01)

(i) *රාග 03 හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නිවැරදිව නම් කිරීමට*

*(එක් රාගයකට ලකුණු 2 බැගින්) (ල. 2×3) = ලකුණු 06*

A) - දේශ් රාගය

B) - බාගේශ්‍රී රාගය

C) - ආසාවරී රාගය

(ii)

ඛයාල් මණ්ඩලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටසේ ... සඳහා පමණක් ලකුණු පිරිනැමේ. එක් විභාගයකට ලකුණු 01 බැගින්. විභාග තාල රාගයට අදාළ ලෙස ස්වර ආරෝහ නම් ගොනුකර ඇති විට සහ ස්වර සංකේත රාගයට අදාළව යොදා ඇති විට අදාළ ලකුණු හිමි නොවේ. [illegible]

*එක් විභාගයකට ලකුණු 01 බැගින් විභාග 8 ට 1×8 = ලකුණු 08*

(iii)

*ඉහත නම් කළ රාග 03 ට අදාළ 'මේල' ලියා ඇති අවස්ථාවක එක් ලකුණ බැගින් (ල. (3×1) = 03*

*සහ 'ගායනසමය' ලියා ඇති අවස්ථාවක එක් ලකුණ බැගින් (ල.(3×1)= 03*

*ල(3.×2) = 06*

A) - දේශ් රාගය - ඛමාජ් මේලය - රාත්‍රී දෙවන ප්‍රහරය

B) - බාගේශ්‍රී රාගය - කාෆි මේලය - රාත්‍රී තුන්වන ප්‍රහරය (මධ්‍යම රාත්‍රිය)

C) - ආසාවරී රාගය - ආසාවරී මේලය - දිවා දෙවන ප්‍රහරය

2.

**2.** (i) නිර්දේශිත රාග තුනකට අදාළ ව සකසා ඇති පහත වගුවෙහි (A) සිට (F) දක්වා හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ලියන්න.

| රාගය | මේලය | ජාතිය | වාදී ස්වරය | සංවාදී ස්වරය |
|---|---|---|---|---|
| භෛරව | භෛරව | (A) .............. | (B) .............. | රි |
| ජයජයවන්ති | (C) .............. | (D) .............. | රි | ප |
| (E) .............. | බිලාවල් | ඖඩව | ස | (F) .............. |

(ලකුණු 06 යි.)

(ii) ඉහත වගුවෙන් පිළිබිඹු වන රාග තුනෙන් කැමති රාගයකට අදාළ [illegible] ගීතයක හෝ වාදිතයෙහි අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 යි.)

(iii) භෛරව රාගය සහ කාලිංගඩා රාගය අතර සමානතා දෙකක් සහ විෂමතා දෙකක් [illegible] ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ජයජයවන්ති රාගයට අදාළව මාත්‍රා 16කින් යුත් තානාලංකාරයක් ලියන්න. (ලකුණු 02 යි.)

*i. A සිට F දක්වා නිවැරදි පිළිතුරු සපයා ඇති විටෙක එක් හිස් තැනක පිළිතුරකට ලකුණු 1 බැගිනි.*

*(1x6) = ලකුණු 06*

වගුවෙහි හිස්තැන් පිරවීම

A - සම්පූර්ණ

B - ධ

C - ඛමාජ්

D - සම්පූර්ණ

E - හංසධ්වනි

F - ප

ii) ඉහත වගුවෙන් පිළිබිඹු වන රාග තුනෙන් කැමති රාගයකට අදාළ [illegible] ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසේ ආවර්තන දෙකක් සඳහා පමණක් ලකුණු පිරිනැමේ. එක් විභාගයකට ලකුණු 01 බැගිනි. විභාග තුළ රාගයට අනුකූල ලෙස ස්වර [illegible] නොමැති විට [illegible] ලකුණු හිමි නොවේ.
සංකේත රාගයට අදාලව නොමැති විට අදාල ලකුණු හිමි නොවේ.

*එක් විභාගයකට ලකුණු 01 බැගින් විභාග 8 ට (1x8)= ලකුණු 08*

iii) රාගවල සමානතා දෙකට එක් කරුණකට ලකුණු. 1 බැගින් 1x2=ලකුණු 2 යි.

අසමානතා දෙකට එක් කරුණකට *ලකුණු. 1 බැගින් 1x2=ලකුණු 2 යි.*

*2x2= ලකුණු 04 යි*

මෙම රාග දෙකෙහිම සමානතා

- රිෂභය සහ ධෛවත ස්වර කෝමල වේ.
- ජාතිය සම්පූර්ණ ලෙස යෙදේ.

- උත්තරාංග වාදී රාග වේ.
- මේලය භෛරව වේ.
- ආරෝහණ / අවරෝහණ ස්වර සමානය. | ස රි ග ම ප ධ නි ස් – ස් නි ධ ප ම ග රි ස
- උදය සංධි ප්‍රකාශ රාග වෙති.
- දිවා ප්‍රථම ප්‍රහරයට අයත්ය.

(මෙහි ආකාරයට සපයා ඇති වෙනත් නිවැරදි පිළිතුරු ද අදාළ කරගන්න.)

අසමානතා

- භෛරව් රාගයේ වාදී සංවාදී ස්වර ධ රි වන අතර කාලිංගඩා රාගයේ ප ස ස්වර වාදී සංවාදී වේ.
- භෛරව් රාගයේ මුඛ්‍යාංගය: ග ම ධ ධ ප ග ම රි ස ලෙසත් යෙදෙන අතර කාලිංගඩා රාගයේ මුඛ්‍යාංගය: ධ ප ග ම ග නි ස රි ස ලෙස යෙදේ.
- භෛරව් රාගයේ වාදී සංවාදී ධ රි ආන්දෝලනය වන අතර කාලිංගඩා රාගයේ එසේ නොවේ.
- භෛරව් රාගයේ රි ධ ස්වර අතිකෝමල වන අතර කාලිංගඩා රාගයේ එසේ නොවේ.
- භෛරව් රාගය මන්ද්‍ර, මධ්‍ය සප්තක වැඩි වශයෙන් ඇසුරු කරන අතර කාලිංගඩා රාගයේ මධ්‍ය හා තාර සප්තක වැඩි වශයෙන් ඇසුරු කරයි.
- රාග දෙකෙහි රාග සංගති වෙනස් ආකාරයෙන් යෙදේ.

උදා: භෛරව්: ග ම ධ ධ ප, ග ම රි ස, ග ම ධ ප රි රි ස

කාලිංගඩා: ධ ප ග ම ග, නි ස රි ස, ධ ප ම ග නි නි ස

භෛරව් රාගය ගම්භීර ප්‍රකෘති රාගයක් වන අතර කාලිංගඩා චංචල ප්‍රකෘති රාගයක් වේ.

*(මෙහි ආකාරයට සපයා ඇති වෙනත් නිවැරදි පිළිතුරු ද අදාළ කරගන්න.)*

iv. *තානාලංකාරයෙහි මාත්‍රා 16 ක් සම්පූර්ණ කිරීම සඳහා (ල. 01 කි.* | ලකුණු 02

*තානාලංකාරයෙහි යෝග්‍යතාවය හා නිරවද්‍යතාවය සඳහා (ල. 01 කි.*

[redacted]

**3.** පහත හිස්තැන් සහිත ස්වර පේළි තුන හොඳින් නිරීක්ෂණය කරන්න. ඉන් දැක්වෙනුයේ නිර්දේශිත [redacted] රාග තුනකට අදාළ නිර්දේශිත ආරෝහණයන් හි **අසම්පූර්ණ** (හිස්තැන් හතර බැගින් වූ) ස්වර පේළි තුනකි.

A ස — ධ — ස ම — ම ධ — ස්

B ස රි ග — — ම ප ධ — — ස්

C ස රි රි — ගු රි ස — ධ — රි — ම ප නි ස්

(i) A, B සහ C හි දැක්වෙන හිස්තැන්වලට අදාළ ස්වර යොදා, සම්පූර්ණ කරන ලද ආරෝහණ ස්වර පේළි A, B සහ C අක්ෂර යටතේ අදාළ රාගයන්හි නම් ද සමග ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(ii) ඔබ විසින් නම් කරන ලද රාග තුනෙන් කැමති රාගයකට අදාළ ඛයාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) ඒක්තාලයෙහි ලේඛාව නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කර, එම ප්‍රස්තාරය යටතෙහි ඉහත (i) කොටස සඳහා ඔබ විසින් නම්කරන ලද රාග තුනෙන් කැමති රාගයක **අවරෝහණයෙහි** ස්වර, පිළිවෙළින් යෙදෙන ආකාරයට එක් ආවර්තයක් සම්පූර්ණ වන ලෙස අදාළ පරිදි මාත්‍රා ඇඳීම් සහිත ව (යති/විශ්‍රාන්ති) ලියන්න. (ලකුණු 06 යි.)

3.

(i) *එක් හිස් තැනක් සඳහා ලකුණු ½ බැගින් හිමිවිය යුතුය.*

*A හි හිස්තැන් 4 ම නිවැරදි නම් ½ × 4 = ල. 02*

*B හි හිස්තැන් 4 ම නිවැරදි නම් ½ × 4 = ල. 02* --- ලකුණු 06

*C හි හිස්තැන් 4 ම නිවැරදි නම් ½ × 4 = ල. 02*

A කාෆි - ( නි නි ග නි )

B තිලක්කාමෝද් - ( ස රි ම ප )

C ජයජයවන්ති - ( රි නි ප ග )

ii.

නම් කරන ලද රාග 03 න් තෝරා ගත් රාගයක ඛයාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටසේ ආවර්තන දෙකක් සඳහා සම්පූර්ණ ලකුණු හිමිවේ. එක් විභාගයකට ලකුණු 01 බැගිනි. විභාග තුළ රාගයට අනුකූල ලෙස ස්වර ආදේශ කර නොමැති විට සහ ස්වර සංකේත රාගයට අදාලව නොමැති විට අදාළ ලකුණු හිමි නොවේ.

*එක් විභාගයකට ලකුණු 01 බැගින් විභාග 8 ට (1x8) = ලකුණු 08*

(iii) තාල සංකේත සහිතව ලේඛාව නිවැරදිව ප්‍රස්තාර කර තිබිය යුතුය.

- ලේඛාවේ නිවැරදි තාවයට — ල. 2
- තාල සංකේතයන් හි නිවැරදිතාවයට — ල. 1
- නිවැරදි ලෙස විභාග වෙන් කර තිබීම — ල. 1
- තෝරාගත් රාගයෙහි **අවරෝහණයේ** නිවැරදිතාවයට — ල. 1
- අවරෝහණ ස්වර තාලාවර්තය සම්පූර්ණ වන අයුරින් නිවැරදිව ගලපා තිබීම — ල. 1

ලකුණු 06

| ධිං | ධිං | ධාගේ | තිරිකිට | තූ | නා | කත් | තා | ධාගේ | තිරිකිට | ධිං | නා |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ස̇ | නි | ධ | ම | ගු | - | මගු | රි | - | ස | - |
| ස̇ | ප | ධ | ම | - | ග | - | ස | රි | ග | ස | නි |
| ස̇ | නි | - | ධප | ධ | - | ම | - | රි | ගු | රි | ස |

*මුළු ලකුණු 20*

II කොටස

4. (i) ගැමි ගී සහ සේ ගී කරුණු තුනක් යටතේ සංසන්දනය කරන්න. (ලකුණු 06 යි.)

(ii) වැලපුම් ගී සහ අස්මන් ගායනා අතර පෙන්නුම් කෙරෙන සමානතා දෙකක් සහ අසමානතා දෙකක් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) පහත කරුණු දෙකට අදාළව ටීකා සී පදවලට ආවේණික ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න.

- පද මාලාව
- නාද මාලාව (ලකුණු 04 යි.)

(iv) "ගැමි ගීය නිර්ව්‍යාජ කලා මාධ්‍යයකි."
පැල් ගී, පතල් ගී සහ පාරු ගී යන ගී වර්ගවලින් දෙකක් තෝරාගෙන එම ගීතවල යෙදෙන පද මාලා ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න. (ලකුණු 06 යි.)

(04)

*(i) ගැමි ගී සහ සේ ගී කරුණු 3 ක් යටතේ සංසන්දනය කිරීමට (ල.2 × 3 = ලකුණු 06 යි.*

*උදා :-*

ස්වර පරාසය

- ගැමි ගී පටු ස්වර පරාසයක් ඇති අතර සේ ගී සංකීර්ණ ස්වර පරාසයකින් යුක්ත වීම.

බස් වහර

- ගැමි ගීයකි බස් වහර සරල ස්වරූපයකින් යුතු අතර සේ ගී සංකීර්ණ බස් වහරකින් යුක්ත වීම.

තාලය

- ගැමි ගී සහ පේ ගී ආඝාතාත්මක හා අනාඝාතාත්මක වශයෙන් ගායනා කිරීම [redacted]

නිර්මාණකරුවන්

- ගැමි ගී ජනයාගේ සිතුම් පැතුම් අනුව නිර්මාණය වී මුඛ පරම්පරාවෙන් පැවතෙන අතර පේ ගී උගතුන් විසින් නිර්මාණය කර ලේඛනගත කර තිබීම.

අවසාන බව

- ගැමි ගීයෙන් ගැමි ජනයාගේ අව්‍යාජ බව පිළිබිඹු වන අතර පේ ගීයෙන් අතිශයෝක්තියෙන් යුත් වර්ණනා පිළිබිඹු වීම.

(ඉහත ආකාරයට ලියා ඇති වෙනත් නිවැරදි කරුණු ද අදාළ කරගන්න)

(ii) වැලපුම් ගී හා අස්නේ ගායනා අතර ඇති සමානතා අසමානතා

*(සමානතා දෙකට ල. 02*
*අසමානතා දෙකට ල. 02)* — ලකුණු 04

උදා :

සමානතා

- ගී වර්ග දෙකම පේ ගී ගණයට අයත් වීම.
- ගී වර්ග දෙකෙහිම වැලපුම් ස්වභාවය පෙන්නුම් කරන අවස්ථා ද ඇත.
- ගී වර්ග දෙකෙහිම විවිධ තාල හා තාලරූප පෙන්නුම් කෙරේ.

අසමානතා

- වැලපුම් ආඝාතාත්මක හා අනාඝාතාත්මකව ගයන අතර අස්නේ ගායනා ආඝාතාත්මකව පමණක් ගැයීම.
- අස්නේ නර්තන අංගයට අනුව ගයනු ලබන අතර වැලපුම් ගී නර්තන අංගයකට අයත් නොවීම.
- කොහොඹා කංකාරිය නම් ශාන්ති කර්මයේ භාවිත වන අස්නේ සැබී වාක්‍යයන්ධි ශෛලියෙන් ප්‍රබන්ධ වී ඇති අතර, වැලපුම් ගී සඳහා එවැනි ශෛලියක් යොදාගෙන නොතිබීම.

(ඉහත ආකාරයට ලියා ඇති වෙනත් සමාන / අසමානතා ද නිවැරදි නම් අදාළ කරගන්න)

(iii) *ටීකා සිපදවලට ආවේණික ලක්ෂණ 02 ක් පහත කරුණු යටතේ පෙන්නුම් කර ඇති විට*

*පදමාලාව හා සම්බන්ධයෙන් ල. 2 යි.*
*නාද මාලාව හා සම්බන්ධයෙන් ල. 2 යි.* — ලකුණු 04

*උදා :-*

පද මාලාව

- ගද්‍ය හා පද්‍ය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වීම.
- ගද්‍ය කොටසේ පද මාලා දීර්ඝ වන අතර පද්‍ය කොටසේ පද මාලාව සිව්පද ආකාරයට පෙන්නුම් කිරීම
- ගද්‍ය භාගය අතිශයෝක්තියෙන් වර්ණනා කර තිබීම.

නාදමාලාව

- ටීකාව කොටස කෙටි ස්වර පරාසයකින් නිර්මාණය වීම.
- පද්‍ය කොටස පුළුල් ස්වර පරාසයක පැතිරීම.
- ටීකාව හා පද්‍ය කොටස්හි ඒකාකාරී වූ නාද මාලාවන් ද පෙන්නුම් කිරීම.

(ඉහත ආකාරයට ලියා ඇති වෙනත් ගැලපෙන පිළිතුරු ද අදාළ කර ගන්න.)

(iv) *ගැමිගීය නිර්මාණ කලා මාධ්‍යයක් බව පෙන්නුම් කිරීම සඳහා ගී වර්ග දෙකක පද මාලා ඇසුරින් පිළිතුරු ලියා තිබීමේදී*

*එක් ගී වර්ගයකින් කරුණු දැක්වීමට ලකුණු 03 බැගින් ගී වර්ග දෙක සඳහා*

*ල. (3x2 ) = ලකුණු 06*

- *එම ලකුණු 03 පහත ආකාරයට ලබා දේ.*

*පද මාලා දැක්වීමට ලකුණු 01*
*සනාථ කිරීමට ලකුණු 01* — ලකුණු 03
*පිළිතුර ගොනු කිරීමට ලකුණු 01*

❖ පතල් ගී සඳහා උදාහරණ :-

උදා:- මැණිකගෙ පැල ළඟින්......

රත්තරන් පතේ

දඩිබිඩි ගගා...

ඉන්නේ දුම්බරයි....

මිනිරන් පතල හරියට අපෙ ගෙදර වගෙයි

❖ පැල් ගී සඳහා උදාහරණ :-

අමන් හිරවුනේ මා බස අසාපන්

හේනේ පැලේ මා විඳිනා

❖ පාරු ගී සඳහා උදාහරණ :-

කැලුවර තොටේ මම් බැහැලා

බෝම්බු ඉදල දල්ලාදෝ කොලාදෝ..

*මුළු ලකුණු 20*

5. (i) පහත සඳහන් කරුණු පාදක කර ගනිමින් නූර්ති සහ නාඩගම් පිළිබඳව සංසන්දනාත්මක විස්තරයක් කරන්න.
   - යොදාගැනෙන ස්වර වාද්‍ය භාණ්ඩ
   - යොදාගැනෙන අවනද්ධ වාද්‍ය භාණ්ඩ
   - ආභාසිත සංගීත සම්ප්‍රදායන්

   (ලකුණු 06 යි.)

(ii) "උතුරු ඉන්දීය සංගීතයේ විකාශය සඳහා ගෝත්‍රික ගීත සහ පද්‍ය ප්‍රබන්ධවලින් ලද දායකත්වය බෙහෙවින් ඉවහල් විය."
ඉහත ප්‍රකාශය පිළිබඳව උදාහරණ දක්වමින් අදහස් දක්වන්න. (ලකුණු 06 යි.)

(iii) උඩරට සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම ගීත පිළිබඳව පහත සඳහන් කරුණු පාදක කරගනිමින් විස්තර කරන්න.
   - නාද රටා සහ ස්වර පරාසයන්
   - කාල ලක්ෂණ හා රිද්ම රටා

   (ලකුණු 08 යි.)

---

*(i) පහත කරුණු 3 ට අදාළව නූර්ති සහ නාඩගම් රංග ශෛලීන් පිළිබඳ සංසන්දනාත්මක පිළිතුර සඳහා නූර්ති හා නාඩගම් සම්බන්ධ එක් කරුණකට ල. 1 බැගින් (3x1) = 03*

- *යොදා ගැනෙන ස්වර වාද්‍ය භාණ්ඩ*
- *යොදා ගැනෙන අවනද්ධ වාද්‍ය භාණ්ඩ*
- *ආභාසිත සංගීත සම්ප්‍රදායන්*

*ලකුණු 06*

❖ යොදා ගැනෙන ස්වර වාද්‍ය භාණ්ඩ

- නූර්ති සඳහා ස්වර වාද්‍ය භාණ්ඩ ලෙස සර්පිනා, වයලින්, යන සංගීත භාණ්ඩ වාදනය කරන අතර නාඩගම් සඳහා හොරණෑව , සර්පිනාව වාදනය කිරීම.

❖ යොදා ගැනෙන අවනද්ධ වාද්‍ය භාණ්ඩ

- නූර්ති සඳහා තබ්ලාව, ඩොල්කි, ඩෝලැක් යන අවනද්ධ භාණ්ඩ යොදා ගන්නා අතර නාඩගම් සඳහා මද්දල් දෙකක් භාවිත කිරීම.

❖ ආභාසිත සංගීත සම්ප්‍රදායන්

- නූර්ති සඳහා උත්තර භාරතීය (හින්දුස්ථානි) සංගීතයේ ආභාසය ලැබී ඇති අතර නාඩගම් සඳහා දක්ෂිණ භාරතීය (කර්ණාටක) සංගීතයේ ආභාසය ලබාතිබීම.

ii. උතුරු ඉන්දීය සංගීතයේ විකාශය සඳහා ගෝත්‍රික ගීතවලින් ලද දායකත්වය පිළිබඳව

| | | |
|---|---|---|
| අදහස් දැක්වීමට | ල. 2 | ලකුණු 03 |
| උදාහරණ සඳහා | ල. 1 | |

උතුරු ඉන්දීය සංගීතයේ විකාශය සඳහා පද්‍ය ප්‍රබන්ධවලින් ලද දායකත්වය පිළිබඳව

| | | |
|---|---|---|
| අදහස් දැක්වීමට | ල. 2 | ලකුණු 03 |
| උදාහරණ සඳහා | ල. 1 | |

*ලකුණු 06*

ගෝත්‍රික ගීතවලින් ලද ආභාසය ට අදාළ කරුණු

- හටියාලි ගීත, බාවුල් ගීත, ටප්පා ගීත ආදියෙන් සංගීත විකාශයට ලද ආභාසය
- තක්ක ගෝත්‍රිකයන් අතර භාවිත නාද මාලාවන්ගෙන් තෝඩ් රාගයට ලද ආභාසය
- රණකාමී ගෝත්‍රිකයන්ගේ මාලව රාගයට ලද ආභාසය
- අභිරාස් ගෝත්‍රිකයන්ගේ අභීර් රාගයට ලද ආභාසය
- සාවේරී ගෝත්‍රිකයන්ගේ සාවරී රාගයට ලද ආභාසය
- කාන්ග්‍රා කඳුකර ගෝත්‍රිකයන්ගේ පහාඩි සහ මාන්ඩ් රාගවලට ලද ආභාසය
- වීරාව ගෝත්‍රිකයන්ගේ භෛරව රාගයට ලද ආභාසය

පද්‍ය ප්‍රබන්ධවලින් ලද ආභාසයට අදාළ කරුණු

- ජයදේවයන් විසින් රචිත ගීත ගෝවින්දයේ බොහෝ පද්‍ය ප්‍රබන්ධ භජන් ගීත ලෙස ගයා වයා තිබීම.
- ඇතැම් කවිවල රාග හා තාල පිළිබඳව දක්වා තිබීම. උදා:- ධීර සමීරේ යමුනා තීරේ..
- ගීත ගෝවින්දයේ ඇතැම් පද්‍ය ප්‍රබන්ධ මාලව, වසන්ත, රාම්කලි,ගුර්ජරී, මාලව ගෞඩී ආදී රාග ඇසුරින් ගයා ඇත. (උදා:- රාම්කලී රාගය ඇසුරින්- චන්දන චර්චිත....)
- කබීර්දාස් කවියා විසින් ප්‍රබන්ධිත පද්‍ය
- සූර්දාස් කවියා විසින් ක්‍රිෂ්ණ දෙවිඳුන් උදෙසා ගීත නිර්මාණය කර තිබීම
- තුල්සිදාස් කවියා විසින් භක්ති ගීත නිර්මාණය කර තිබීම.
- මීරාබායි කිවිඳියගේ භක්ති ගීත නිර්මාණයන් සඳහා පද්‍ය ප්‍රබන්ධ බලපා තිබීම.

(ඉහත ආකාරයට ලියා ඇති වෙනත් නිවැරදි පිළිතුරු ද අදාළ කරගන්න.)

(iii) උඩරට සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්ම ගීත පිළිබඳ ඉදිරිපත් කර ඇති තොරතුරු සඳහා ලකුණු පිරිනැමීමේදී පහත උපදෙස් පිළිපදින්න.

උඩරට සම්ප්‍රදායේ ශාන්තිකර්ම ගී හා සම්බන්ධ:-

*නාදරටා හා ස්වර පරාසයන් ල. 2*
*තාල ලක්‍ෂණ හා රිද්ම රටා ල. 2* } ලකුණු 04

පහතරට සම්ප්‍රදායේ ශාන්ති කර්ම ගී හා සම්බන්ධව :-

*නාදරටා හා ස්වර පරාසයන් ල. 2*
*තාල ලක්‍ෂණ හා රිද්ම රටා ල. 2* } ලකුණු 04 ලකුණු 08

*උදා:-*

නාදරටා හා ස්වර පරාස

- සරල නාද රටා මෙන්ම සංකීර්ණ නාදරටාවලින් යුක්ත වීම.
- උස් හඬින් ගායනය කිරීම.
- කවි කිහිපයක්ම එකම නාද මාලාවට අනුව ගැයීම.

[redacted]

- නර්තනය හා ගැලපෙන ලෙස නාදරටා ගොඩ නැගී තිබීම.
- සංකීර්ණ ලෙස විහිදුනු ස්වර පරාසයන්ගෙන් යුතු ගීත ද ඇති බව


තාල ලක්ෂණ හා රිද්ම රටා

- දේශීය තිත් ක්‍රමයට, විවිධ මත්කැටි අනුව තාල වැයීම
- විවිධ රිද්ම රටා හා බැඳි ගීත භාවිතය
- ආඝාතාත්මක සහ අනාඝාතාත්මක ලෙස ගී නිර්මාණය වී තිබීම
- අවේණික තාල වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම
- ආවේණික බෙර පද යොදා ගැනීම

(ඉහත ආකාරයට ලියා ඇති වෙනත් නිවැරදි පිළිතුරු ද අදාළ කරගන්න.)

## III කොටස

6.



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයට අයත් ටයිම් සිග්නේචරය (Time signature) ලියන්න. (ලකුණු 02 යි.)

(ii) එම ස්වර ප්‍රස්තාරයෙහි පිළිවෙළින් යෙදෙන 3, 5, 6 සහ 7 විභාගවලට අදාළ ස්වර ප්‍රස්තාර කොටස් පෙරදිග ස්වර ප්‍රස්තාර ක්‍රමය අනුව පෙරළා, අදාළ අංක ද සමග වෙන් වෙන් වශයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) Pianissimo (පියැනිසිමෝ), Forte (ෆෝර්ටේ), Pizzicato (පිසිකාටෝ), Fortissimo (ෆෝර්ටිසිමෝ), Legato (ලෙගාටෝ) සහ Mezzo forte (මෙසො ෆෝර්ටේ) යන කරුණු (ප්‍රකාශන සංකේත) අතුරෙන් හතරක් තෝරාගෙන ඒ එකිනෙකට අදාළ සංකේත ද සමග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

(iv) පහත දැක්වෙන ස්වර පාද තුනට ගැළපෙන බටහිර සංගීත කෝඩ්ස්, ප්‍රස්තාරයට අදාළ ලෙස විභාග යටතේ සළකුණු කරන්න.

| ස ස‍ග ප | ධ ම රි | නි ප නිරි | ස – – |

| ග ප ස් | නි – ප | ධ මරි ම | ග – ප |

| රි – ම | ග – ප | ම රි නි | ස – – | (ලකුණු 06 යි.)

06)

i. ටයිම් සිග්නේචරය ලිවීමට

(අපරදිග ස්වර ප්‍රස්තාරය අයත් ටයිම් සිග්නේචරය (Time Signature). 4/4 Time) ල. 2

ii. පෙරදිග ස්වර ප්‍රස්තාර ක්‍රමය අනුව පෙරලා ප්‍රස්තාර කොටස් ලිවීමට එක් විභාගයකට ලකුණු 1 බැගින් විභාග 04 සඳහා ල. 4

3, 5, 6, හා 7 යන විභාගවලට අදාළ ස්වර ප්‍රස්තාර

| | | | | |
|---|---|---|---|---|
| 3. | නි | -ස | ධ | +නි |
| 5. | ස | ස්ස | +ස | ග් |
| 6. | -ම් | -රි | ස | - |
| 7. | ග | - | - | රිග |

(iii) තෝරා ගත් ප්‍රකාශන සංකේත 04 ට අදාල සංකේත ද සමග කෙටියෙන් පැහැදිලි කිරීමට

එක් සංකේතයක් පැහැදිලි කිරීම ල. 1

සංකේතය දැක්වීම ල. 1

ඒ අනුව සංකේත 4 ට (2x4) ලකුණු 8

PP / Pianissimo - හඬ ඉතා අඩුවෙන් වාදනය කිරීම.

F / Forte - තරමක් හඬ වැඩියෙන් වාදනය කිරීම.

/ Pizzicato - බෝව අල්ලා ගත් අතේ දබර ඇඟිල්ලෙන් ස්වර වාදනය කිරීම.

FF/ Forti simo - හඬ ඉතා වැඩියෙන් වාදනය කිරීම.

Legato - අදාළ ස්වරය හෝ ස්වර සමූහය ඉතා මෘදු හා සියුම් ලෙස වාදනය කිරීම.

MF/ Mezzo Forte - ස්වර ඉතාමත්ම වැඩි හඬින් වාදනය කිරීම.

(iv) ස්වර ප්‍රස්තාරයට ගැළපෙන ලෙස කෝර්ඩ්ස් අනු පිළිවෙලින් විභාග මත ලකුණු කිරීම සඳහා

එක් විභාගයකට ලකුණු ½ බැගින් හිමිවේ. ඒ අනුව විභාග 12 x ½ ලකුණු 06

| | | | |
|---|---|---|---|
| C - - | Dm - | G - - | C - - |
| C - - | G/E - | Dm/F - - | C |
| Dm - - | C/Em - - | G/G7 - - | C - - |

7. (i) පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය චිත්‍රපට කිහිපයකට අදාළ තොරතුරු කිහිපයකි. එම වගුවෙහි (1) සිට (8) තෙක් ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු අදාළ අංකය ද සමග ලියා දක්වන්න.

| නිර්දේශිත චිත්‍රපටය | ගීතය | සංගීත අධ්‍යක්ෂ | ගායකයා/ගායිකාව |
|---|---|---|---|
| මාතලන් | කොවුලන් හඬයි | (1) .................. | ධර්මදාස වල්පොල |
| (2) .................. | මිලු නෙලුම් නෙරිය රඟාලා | බී.එස්. පෙරේරා | (3) .................. |
| (4) .................. | ගලන ගඟකි ජීවිතේ | (5) .................. | නන්දා මාලිනී/ නාරද දිසාසේකර |
| (6) .................. | සිනිඳු සුදු මුදු තලාවේ | (7) .................. | (8) .................. |

(ලකුණු 08 යි.)

(ii) "ශ්‍රී ලංකාවේ ස්වතන්ත්‍ර චිත්‍රපට සංගීත නිර්මාණයේ සංධිස්ථානයක් ලෙස 'රේඛාව' චිත්‍රපටය සුවිශේෂී වේ." මෙම ප්‍රකාශය පිළිබඳ ව පහත සඳහන් කරුණු යටතෙහි අදහස් දක්වන්න.

- ගී තනු හා පද මාලා
- සංගීතය

(ලකුණු 06 යි.)

(iii) රාගධාරී සංගීත ආභාසයකින් නිර්මාණය වී ඇති නිර්දේශිත ව්‍යවහාරික සරල ගීතයක් නම් කර, ඒ පිළිබඳ ව පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ඇගයීමක් කරන්න.

- තනු නිර්මාණය සඳහා පාදක වූ රාගය
- යොදා ඇති විවිධ රාගධාරී ශාස්ත්‍රීය අංග (තනුවේ පිහිටා ඇති ආකාරයට අනුව) (ලකුණු 06 යි.)

(i) *චිත්‍රපට ගීත ඇතුළත් වගුව සම්පූර්ණ කිරීමට*

*එක් හිස්තැනකට අදාළ පිළිතුරකට ලකුණු 01 බැගින් හිමි වේ. හිස්තැන් 08 × ල.1*

*ලකුණු 08 යි.*

(i) ආර්. මුත්තුසාමි

(ii) රේඛාව

(iii) සිසිර සේනාරත්න

(iv) රන්මුතුදූව

(v) ඩබ්. ඩී.. අමරදේව

(vi) සත් සමුදුර

(vii) සෝමදාස ඇල්විටිගල

(viii) ඩබ්. ඩී. අමරදේව

(ii)

- රේඛාව චිත්‍රපටය හා සම්බන්ධ තොරතුරු යටතේ ගීතනු පදමාලා හා සංගීතය සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී

ii. *රේඛාව චිත්‍රපටයේ ගී තනු පිළිබඳව තොරතුරු* *ල. 02 යි.*

*රේඛාව චිත්‍රපටයේ ගී පද මාලා පිළිබඳව තොරතුරු* *ල. 02 යි.* } *ලකුණු 06*

*රේඛාව චිත්‍රපටයේ සංගීතය පිළිබඳව තොරතුරු* *ල. 02 යි.*

චිත්‍රපටයේ ගී තනු සහ පදමාලා, (අදාළ කරුණු සඳහා උදාහරණ)

- දේශීය ආරයට තනු නිර්මාණය වීම
- සුනිල් සාන්ත සූරීන් විසින් ගීතනු නිර්මාණය කර තිබීම.
- එතෙක් පැවති ද්‍රවඩ අනුකරණයෙන් මිදී ස්වාධීන, දේශීයත්වයට නැඹුරු ගී තනු නිර්මාණයට යොමු වීම.
- ප්‍රථම වරට චිත්‍රපට සංගීතයට විරිදු පංතියක් ඇතුළත් වීම.
- මර්සලින් ජයකොඩි පියතුමා විසින් ගීපද මාලා නිර්මාණ කිරීම.
- බොහෝ ගී පදමාලා ස්වභාව සෞන්දර්ය වර්ණනාවන්ගෙන් යුක්ත වීම.
- පදමාලා සරල වීම.

සංගීතය

- ඉන්දියානු ශබ්දාගාරයන්හි ඉන්දීය වාදන ශිල්පීන් සමග ස්වතන්ත්‍ර නිර්මාණ පටිගත කිරීම.
- සංගීත අධ්‍යක්ෂණය බී. එස්. පෙරේරා සූරීන් විසින් සිදුකර තිබීම.
- සිසිර සේනාරත්න, ඉන්ද්‍රානි විජේබණ්ඩාර, අයිවෝ ඩෙනිස් වැනි මෙරට ගායක ගායිකාවන් විසින් ගායනයේ යෙදීම
- දොහොරා, (adlib) විරිදු පංති, වැනි ගායන අංග ඇතුළත් වීම.
- 6/8, 4/4 වැනි රිද්ම රටාවන් අනුව වැඩි වශයෙන් ගීත නිර්මාණය වී තිබීම.
- ගී පදමාලාවන්ගෙන් හා රූප රාමුවලින් කියැවෙන මනෝ භාවයන් තීව්‍ර කිරීමට සමත් ලෙස ගී තනු නිර්මාණය වී තිබීම.

(iii)

- රාගධාරි සංගීත ආභාසයකින් නිර්මාණය වී ඇති ගී සරල ගීයක් නම් කිරීමට ල. 01

(හෝපලු වනපෙත, හංසරාජිණී, මුව මුක්තා ලතා, මාරම්බරී, කමලාසනී සහ එවැනි අදාළ ගීත අතරින් ගීතයක් නම් කිරීම)

- අදාළ ගිතයේ තනු නිර්මාණය සඳහා පාදක වූ රාගය නම්කර තිබීම ල. 01
- ආලාප, තානාලංකාර, සබීලා සංවාද, රාගඅංග,මීන්ඩ් ගමක් මූර්ඡනා වැනි ශිල්ප ක්‍රම භාවිතය, ස්ථායි අන්තරා ආකෘතිය, තිහායි වැනි රාගධාරී ශාස්ත්‍රීය අංග ගී තනුවේ පිහිටා ඇති ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කර තිබීම. ල. 04

(ඉහත එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 04 ක් සඳහා ලකුණු 4 කි)

*ලකුණු 06*

[redacted]

8. (i) පහත පද රචනාවට උචිත තනුවක්, අ.පො.ස. උසස් පෙළට නිර්දේශිත රාගයක් ආශ්‍රය කරගනිමින් නිර්මාණය කර ගීත ස්වර ප්‍රස්තාර කරන්න. නිර්මාණය සඳහා ආශ්‍රය කරගත් රාගයෙහි නම ද ලියන්න.

'පහන් දොරින් හිරු නැගෙන වෙලාවේ

නැවුම් හැඟුම් හද පුබුදු කරාවී'

(ලකුණු 08 යි.)

(ii) ශ්‍රී ලාංකීය සංගීතවේදියකු විසින් 'සංධ්වනි' ආකෘතියට වඩාත් සමීප ලෙසින් සිදුකර ඇති සංගීත නිර්මාණයක් නම් කර, සංධ්වනි ආකෘතියට එහි ඇති සමීප බව පෙන්නුම් කිරීම සඳහා සුවිශේෂී කරුණු තුනක් යටතෙහි අදහස් දක්වන්න.

(ලකුණු 08 යි.)

(iii) පහත කරුණු දෙකක් පිළිබඳ උදාහරණ දක්වමින් කෙටියෙන් හඳුන්වන්න.

(a) ගාන සමය

(b) හාර්මනි (Harmony)

(c) වන්නම

(ලකුණු 04 යි.)

❋ ❋ ❋

i. ගීත ස්වර ප්‍රස්තාර පේළි දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙන්න. එක් පෙළකට ලකුණු 4 ක් බැගින් ලබා දීමේදී පහත කරුණු අදාළ කර ගන්න.

- ➢ ගී තනුවෙන්, තෝරාගත් රාගයට අදාල සංගති හෝ රාගාංග පිළිබිඹු වීමට - ල. 01
- ➢ පද මාලාවට උචිත තාලය ගැලපෙන ලෙස යොදා ගැනීමට - ල. 01
- ➢ ගීත ස්වර ප්‍රස්තාරකරණයේ නිවැරදි බව සඳහා - ල. 01
- ➢ නිර්මාණාත්මක බව සඳහා - ල. 01

ඒ අනුව

- පළමු පෙළට ල. 04 යි.
- දෙවන පෙළට ල. 04 යි.

ලකුණු 08

ii. *සංධ්වනි ආකෘතිය සහිත සංගීත නිර්මාණයක් නම් කිරීමට ල. 02*

*සංධ්වනි ආකෘතියට සමීප බව පෙන්වීම සඳහා සුවිශේෂී කරුණු 03 යටතේ අදහස් දැක්වීම*

*එක් සුවිශේෂී කරුණකට ලකුණු 2 ක බැගින් කරුණු 3 ට (2x3)= ල. 06*

*ලකුණු 08*

- සංධ්වනි ආකෘතියට සමීප නිර්මාණ:- ~~සත් සමුදුර~~, වැස්ස, මගේ කාලයේ මවුනි, ගොයම් දා මගුල, පත්සිළු, හිරගෙයින් මරු මුවට,
සංධ්වනි ආකෘතියට ඇති සමීප බව
    - සංගීත භාණ්ඩ රාශියක් භාවිතය
    - බටහිර සංගීත ශිල්ප ක්‍රම භාවිතය
    - හඬතල හතර භාවිතය
    - තේමාවක් තිබීම.
    - විවිධ ස්වර පරාසයන්ට අයත් සංගීත භාණ්ඩ භාවිතය
    - එක් නාද මාලාවක් නැවත නැවත පෙන්නුම් කිරීම

iii. තෝරා ගත් කරුණු දෙකක් උදාහරණ සහිතව කෙටියෙන් හැඳින්වීම සඳහා පහත ආකාරයට ලකුණු පිරිනැමේ.

*එක් කරුණක් හැඳින්වීමට ල. 01 සහ උදාහරණයට ලකුණු 01 බැගින් ල. 02 කි. ඒ අනුව කරුණු 02 ක් සඳහා ලකුණු 02 × 2 = 4*

*ලකුණු 04*

a) ගානසමය

- රූප සටහනක් මගින් හෝ විස්තරාත්මකව හඳුන්වා දී තිබීම.
- රාග ගායන/වාදනය කිරීමට සුදුසු වේලාවන් සඳහන් කර තිබීම.
- පූර්වාංගවාදී රාග, උත්තරාංගවාදී රාග හා සන්ධි ප්‍රකාශ රාග පිළිබඳ සඳහන් කර තිබීම
- දිනය ප්‍රහර 8 කට බෙදෙන බව සඳහන් කර තිබීම.
- රාත්‍රි හා දිවා යනුවෙන් ප්‍රහර නම් කර තිබීම.
(මීට අමතරව සපයා ඇති නිවැරදි තොරතුරු අදාළ කරගන්න.)

b) හාර්මනි

- බටහිර සංගීත ශිල්ප ක්‍රමයකි.
- යම් කිසි සිද්ධාන්තයක් අනුව ගැළපෙන නාද මාලා කිහිපයක් එකවර නාද වීමෙන් හාර්මනි සෑදේ.

උදා:-

| ස ස ස / රි රි රි / ග - රි / ස - - |
| ග ග ග / ම ම ම/ ප - ම / ග - - |
| ප ප ප/ ධ ධ ධ / නි - ධ/ ප - - |

c) වන්නම්

- නර්තනය හා සම්බන්ධ කලා අංගයකි.
- උඩරට, පහතරට හා සබරගමු වශයෙන් බෙදේ.
- සම්ප්‍රදාය අනුව ආකෘතිය වෙනස් වේ.
- තාල වාද්‍ය භාණ්ඩ ද එකිනෙකට වෙනස්ය.
- ගායනය සමග නර්තනයද සිදු කෙරේ.
- තානම සම්ප්‍රදායන් තුනෙහිම යෙදේ.

*මුළු ලකුණු 20*